Annexure 01

# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - නර්තන හා නාට්‍ය කලා පීඨය

**නර්තන උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනීමේ**

**ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය - 2025**

උක්ත පරීක්ෂණයේදී අපේක්ෂකයන්ට ලකුණු ලැබෙන්නේ සයදෙනෙකුගෙන් සමන්විත විශ්වවිද්‍යාලයේ අභ්‍යයන්තර ආචාර්යවරුන් හා බාහිර විෂය ප්‍රවීණයන්ගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයකිනි. පරීක්ෂකවරු සංවාදකොට ලකුණු ලබාදීම සපුරා තහනම් වේ. විනිවිදභාවය සහතික කිරීම, බලපෑම් කිරීමට ඇති අවකාශය ඉවත් කිරීම හා අපේක්ෂක අපේක්ෂිකාවන්ට ඉහළම සාධාරණයක් ඉෂ්ඨ කිරීම පිණිස මෙම ක්‍රමවේදය විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලැබේ.

## 01 අපේක්ෂකයන් සඳහා පොදු උපදෙස් පත්‍රය

- අදාළ දින නියමිත වේලාවට පරීක්ෂණය සඳහා විශ්වවිද්‍යාලයට පැමිණිය යුතුය.
- සුදුසු ප්‍රායෝගික පුහුණු ඇඳුම් කට්ටලයකින් පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.
- යම්කිසි අපේක්ෂකයෙකු සතුව අන්තර්ජාතික, ජාතික සහ පළාත් මට්ටමින් සහතිකපත් ඇත්නම් ඒවා වෙන් වෙන්ව ඡායා පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය.
- නර්තනය සඳහා සංගීත ඛණ්ඩයක් භාවිතා කරන්නේ නම් Pen Drive එකක් මගින් පමණක් ලබාදිය යුතුය.

## 02 විභාග ක්‍රමවේදය

පහත නිර්ණායකයන් යටතේ ලකුණු ලබාදීම සිදුකෙරේ.

1. ප්‍රාසංගික දැනුම කුසලතා ඉදිරිපත් කිරීම - ප්‍රධාන
2. ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම - උප ප්‍රධාන
3. වෙනත් ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම
4. වාචික පරීක්ෂණය
5. සහතික පත්‍ර පරීක්ෂාව

**අදාළ ඇගයීම සිදු කරන ආකාරය**

### 2.1 ගායන කුසලතා ඉදිරිපත් කිරීම (ලකුණු 10 - කුසලතා)

2.1.1 අපේක්ෂකයාගේ අභිමතය පරිදි තෝරාගත්, තම ගායන කුසලතා මැනවින් ඉදිරිපත් කළහැකි ජන ගායනයක් හෝ සාම්ප්‍රදායික ගායනයක් විනාඩි 02කට නොවැඩි වනසේ ඉදිරිපත් කළ යුතුය.

**2.2 ප්‍රාසංගික දැනුම , කුසලතා ඉදිරිපත් කිරීම - ප්‍රධාන** **(කුසලතා ලකුණු 40)**

2.2.1 විනාඩි 03ක උපරිමයකින් යුතු උඩරට/ පහතරට/ සබරගමු/ භරත නාට්‍යම්/කථක් /බෙර වාදනය මෙයින් එක් සම්ප්‍රදායකට අයත් ශාස්ත්‍රීය නර්තනයක් හෝ ශාස්ත්‍රීය වාදනයක් ඉදිරිපත් කිරීම.

මෙහිදී,

- උඩරට/ පහතරට/ සබරගමු/ නර්තන සම්ප්‍රදායට අදාළ ඉදිරිපත් කිරීමක දී ගායනය කරමින් නර්තනයේ යෙදීම අනිවාර්ය වේ.
- භරත/කථක් නර්තනයේ දී ගායන ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර සංගීත ඛණ්ඩය අපේක්ෂකයා විසින් රැගෙන ආ යුතුය. ප්‍රතිවාදන (playback) පහසුකම් විශ්වවිද්‍යාලය විසින් සපයනු ලැබේ.
- බෙර වාදන ඉදිරිපත් කිරීමක දී ගායන අංග සහිත වාදනය සිදු කළ යුතුය.

2.2.2 **අපේක්ෂකයාගේ ඉදිරිපත් කිරීමට අදාළ විෂයානුබද්ධ සාමාන්‍ය දැනීමේ ප්‍රශ්නය**

**( ලකුණු 10 -දැනුම )**

- අපේක්ෂකයා විසින් ඉදිරිපත් කරන ලද නර්තන / වාදන කොටසට අදාළ දැනුම මැන බැලීමේ ප්‍රශ්නයක් (open ended) විභාග මණ්ඩලයේ පරීක්ෂකයෙකු විසින් ඔබගෙන් විමසනු ලබයි.

**2.3 ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම - උප ප්‍රධාන** **(ලකුණු 10 - කුසලතා)**

2.3.2 පළමු ඉදිරිපත් කිරීම වශයෙන් නර්තනය තෝරාගත් අපේක්ෂකයන් මෙහිදී බෙර වාදනයක් ඉදිරිපත් කළ යුතුය.

2.3.3 පළමු ඉදිරිපත් කිරීම වශයෙන් තාල වාදනය තෝරාගත් අපේක්ෂකයන් මෙහිදී උඩරට/ පහතරට/සබරගමු/ භරත/කථක් නර්තනයක් ඉදිරිපත් කළ යුතුය.

**2.4 වෙනත් ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම** **(ලකුණු 05 - කුසලතා)**

2.4.1 වෙනත් ප්‍රාසංගික කුසලතාවක් විනාඩි 02කට නොවැඩි කාලයක් තුළ ඉදිරිපත් කළ යුතුය.

(නිදසුන්: රංගනය/ නිවේදනය/ කථිකත්වය/ ජිම්නාස්ටික්..ආදී)

**2.5 වාචික පරීක්ෂණය** **(ලකුණු 10- දැනුම, ආකල්ප)**

වාචික පරීක්ෂණය ප්‍රශ්න දෙකකින් සමන්විත වේ.

**2.5.1 පළමු ප්‍රශ්නය** **(ලකුණු 10 - දැනුම )**

සිනමාව, රූපවාහිනිය, සංහතික මාධ්‍ය, නව මාධ්‍ය, සන්නිවේදනය, සංස්කෘතිය, කලාව පිළිබඳ සාමාන්‍ය දැනුම සහ ආකල්ප මැන බලන ප්‍රශ්න 01ක් ඔබ වෙත ඉදිරිපත් කෙරේ.

**2.6 සහතික පත්‍ර පරීක්ෂාව** **(කුසලතා, දැනුම - ලකුණු 10)**

2020 වර්ෂයේ ජනවාරි 01 දින සිට 2025 වර්ෂයේ ප්‍රායෝගික පරීක්ෂණ දිනය දක්වා ලබා ගන්නා ලද අන්තර්ජාතික, ජාතික, පළාත් ජයග්‍රහණ සහ අවමයෙන් එක් අවුරුදු ඩිප්ලෝමා /සහතිකපත් පාඨමාලා සඳහා ලකුණු ලබාදීම සිදු කෙරේ.

03 ඇගයීමේ නිර්ණායක

| | ඉදිරිපත් කිරීම | ඇගයීම් නිර්ණායකය | ලකුණු | සමස්ත ලකුණු |
|---|---|---|---|---|
| 2.1 | **ගායන කුසලතා ඉදිරිපත් කිරීම** | ශ්‍රැතිය | 02 | 10% |
| | | උචිත නාද මාලාව | 04 | |
| | | තාලාවබෝධය | 04 | |
| 2.2.1 | **ප්‍රාසංගික දැනුම , කුසලතා ඉදිරිපත් කිරීම - ප්‍රධාන**<br><br>(නර්තනය හෝ බෙර වාදනයෙන් එක් අංගයක් පමණක් තෝරා ගත යුතුය) | **නර්තන** | | |
| | | සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ | 15 | |
| | | නිවැරදි අංගහාර භාවිතය | 10 | |
| | | නිවැරදි තාලරූප භාවිතය | 10 | |
| | | නර්තනය සමග උචිත ගායනය | 05 | |
| | | ප්‍රාසංගිකත්වය | 05 | |
| | | **බෙර වාදන** | | |
| | | සාම්ප්‍රදායික බව හා වාදන අක්ෂර නිරවද්‍යතාව | 15 | |
| | | අලංකාර පද වාදනය | 10 | |
| | | තාල නිරවද්‍යතාව | 10 | |
| | | වාදනය සමග ගායනය | 05 | |
| | | ප්‍රාසංගිකත්වය | 05 | 45% |
| 2.2.2 | **අපේක්ෂකයාගේ ඉදිරිපත් කිරීමට අදාළ විෂයානුබද්ධ සාමාන්‍ය දැනීමේ ප්‍රශ්නය** | දැනුම, විචාරශීලී බව | 10 | 10% |
| 2.3 | **ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම - උප ප්‍රධාන**<br><br>(නර්තනය හෝ බෙර වාදනයෙන් එක් අංගයක් පමණක් තෝරා ගත යුතුය) | **නර්තන** | | |
| | | සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ | 03 | |
| | | නිවැරදි අංගහාර භාවිතය | 02 | |
| | | නිවැරදි තාලරූප භාවිතය | 02 | |
| | | නර්තනය සමග උචිත ගායනය | 01 | |
| | | ප්‍රාසංගිකත්වය | 02 | |
| | | **බෙර වාදන** | | |
| | | අලංකාර පද වාදනය | 03 | |
| | | වාදන අක්ෂර නිරවද්‍යතාව | 03 | |
| | | තාල නිරවද්‍යතාව | 02 | |
| | | වාදනය සමග ගායනය | 01 | |
| | | ප්‍රාසංගිකත්වය | 01 | 10% |
| 2.4 | **වෙනත් ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම** | නිර්මාණාත්මකබව | 03 | 05% |
| | | ප්‍රාසංගිකත්වය | 02 | |
| 2.5 | **වාචික පරීක්ෂණය** | | | |
| | 2.5.1 පළමු ප්‍රශ්නය | දැනුම | 10 | 10% |
| 2.6. | **සහතික පත්‍ර පරීක්ෂාව**<br>**(දැනුම සහ කුසලතා සහතික කරමින් ලබාගත් ජයග්‍රහණ සඳහා)** | | | |

| ප්‍රවීණතාව | ලබාගත් ස්ථානය | එක් ජයග්‍රහණයකට ලබා දෙන ලකුණු | ලබාගත හැකි උපරිම ලකුණු |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| **විදේශීය තරඟ ජයග්‍රහණ**<br>ජාත්‍යන්තරව පිළිගත් සහතික පමණක් මෙහිදී සලකා බලනු ලැබේ. | ප්‍රථම දෙවන හෝ තෙවන ස්ථාන | 05 | |
| **දේශීය ජාතික තරඟ ජයග්‍රහණ** | ඒකල ප්‍රථම ස්ථාන | 04 | |
| | ඒකල දෙවන ස්ථාන | 03 | |
| | ඒකල තෙවන ස්ථාන | 02 | |
| | සමූහ ප්‍රථම ස්ථාන | 03 | |
| | සමූහ දෙවන ස්ථාන | 02 | |
| | සමූහ තෙවන ස්ථාන | 01 | |
| **දේශීය පළාත් තරඟ ජයග්‍රහණ**<br>මෙම ජයග්‍රාහී අංගයම ජාතික මට්ටමේ දී ජයග්‍රහණය කර ඇතිනම් ලකුණු හිමිවන්නේ ජාතික ජයග්‍රහණයට පමණි | ඒකල/ සමූහ ප්‍රථම ස්ථාන | 01 | |
| **අවමයෙන් එක් අවුරුදු ඩිප්ලෝමා සහතිකපත් පාඨමාලා** | | 05 | **10%** |
| **මුළු ලකුණු** | | | **100%** |

## 04 (Feedback) ප්‍රතිචාර ලබා ගැනීමේ ක්‍රමවේදය

ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සහභාගීවන අපේක්ෂකයන් විසින් සහභාගීත්ව පහසුකම්, තොරතුරු සඳහා පිවිසීමේ පහසුකම්, පරීක්ෂණයේ ගුණාත්මක බව, ප්‍රමිතිය, අත්දැකීම, විශ්වාසනීයත්වය බව ශ්‍රේණිගත කරන තොරතුරු රැස්කිරීම පිණිස නිර්නාමික පත්‍රිකාවක් මගින් ප්‍රතිචාර (Feedback) ලබාගනී. මෙහිදී අපේක්ෂකයාගේ පෞද්ගලික තොරතුරු කිසිවක් ලබා නොගැනේ.